**නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය**

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය(CIDA)**

CONSTRUCTION INDUSTRY
DEVELOPMENT AUTHORITY
(SUCCESSOR TO ICTAD)

# තාක්ෂණ විගණනය

ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ (ICTAD) නෛතික අනුප්‍රාප්තිකයා වන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය(CIDA) ඉදිකිරීම් කර්මාන්තයේ බලයලත් නියාමන අධිකාරිය වශයෙන් 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 45 (1) වන වගන්තිය ප්‍රකාරව, යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් සම්බන්ධයෙන් එම ඉදිකිරීම් කටයුතුවල අයිතිකරු විසින් හෝ රජයේ ආයතනයක් විසින් කරනු ලබන ඉල්ලීමක් මතඑම හඳුනාගත් ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් තාක්ෂණ විගණනයක් කිරීමට ගැසට් පත්‍ර අංක 2057/5 මගින් 2018.02.05 දින මගින් බලය පවරනු ලැබ සිටී.

තාක්ෂණ විගණනය යනු,

වර්ෂ 2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත අනුව ඉදිකිරීම් ක්‍රියාදාමය සහ කළමනාකරන පටිපාටිය මෙන්ම අවසන් නිෂ්පාදනය ඇතුළත්වන්නාවූ හඳුනාගත් ඉදිකිරීම් වැඩ පරික්ෂා කිරීම සහ ගිවිසුමට අදාළ ලේඛන සහ ගිවිසුම් මත කරනු ලබන ගෙවීම් වලට සම්බන්ධ ලේඛන පරික්ෂා කිරීමද වේ.

අ) වර්ෂ 2014 අංක 33 දරණ පනතේ අවශ්‍යතාවලට අනුකූලව සකසන ලද හඳුනාගත් ඉදිකිරීම් වැඩවලට සම්බන්ධ ප්‍රලේඛන හා අනුකූල විම ;

ආ) එම පනතේ විධිවිධානවලට සහ ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව හඳුනාගත් ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කිරිම;

ඇ) ගිවිසුමේ දක්වා ඇති පාර්ශවයන් විසින් ගිවිසුම යටතේ ඔවුන්ගේ නියමිත බැඳීම්වලට අනුකූලව ක්‍රියාකිරිම ; සහ

ඈ) කාර්යක්ෂම සම්පත් සහ බලශක්ති උපයෝජන ප්‍රමිතීන් ඇතුළත්වන්නාවූ මූලික මහජන සෞඛ්‍ය , වෘත්තීමය සෞඛ්‍ය සහ පාරිසරික ප්‍රමිතීන් සහ තාක්ෂණ ප්‍රමිතීන් හා අනුකූල විම.

ඒ අනුව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතට අනුව අධිකාරිය විසින් යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් සම්බන්ධයෙන් එම ඉදිකිරීම් කටයුතුවලඅයිතිකරු විසින් හෝ රජයේ ආයතනයක් විසින් කරනු ලබන ඉල්ලීමක් මත එම හඳුනාගත් ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් තාක්ෂණ විගණනයක් කළ යුතුය.

පනතේ 45 (4) වගන්තිය ප්‍රකාරව තාක්ෂණ විගණනය සිදුකිරිමේ කාර්යයCIDA හි ලියාපදිංචිකළ ගුණාත්මක කළමණාකරන විගණකවරුන් විසින් කළ යුතුය.

2018 අප්‍රේල් මස 05වන දින ගැසට් පත්‍ර අංක 2065/41 යටතේ පළවූ නීති මගින් තාක්ෂණ විගණනය සඳහා අවශ්‍යවන ගුණාත්මක කළමණාකරන විගණකවරුන් ලියාපදිංචිකිරීමේ ක්‍රියාපටිපාටිය සහ ලියාපදිංචියට අවශ්‍යය සුදුසුකම් දක්වා ඇත.

තාක්ෂණ විගණන සේවාව ලබාගැනීමට කැමති ඕනෑම අයෙකුට අයදුම්පත්‍රය http://www.cida.gov.lk (CIDA) වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැක. තවද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, "සව්සිරිපාය", 123, විජේරාම මාවත, කොළඹ 07 පිහිටි තොරතුරු මධ්‍යස්ථානයෙන් පෙ.ව 09.00 සිට ප.ව 03.00 දක්වා රාජකාරි දිනයන්හිදි නොමිලේ අයදුම්පත්‍ර ලබාගත හැක. නිසි ආකාරයෙන් පුරවන ලද අයදුම්පත්‍රය අදාළ විස්තර සමග අධ්‍යක්ෂ ජනරාල්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, "සව්සිරිපාය", 123, විජේරාම මාවත, කොළඹ 07 වෙත යොමු කළ යුතුය.

වැඩිදුර විස්තර අධ්‍යක්ෂ (උපදේශන සේවා) දුරකථන අංක 011-2688143 මගින් ලබාගත හැක.

සභාපති,
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,
"සව්සිරිපාය",
123, විජේරාම මාවත,
කොළඹ 07.
2019/07/04